# සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
# சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
# Department of Samurdhi Development

කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය
மகளிர் சிறுவர் அலுவல்கள் மற்றும் சமூக வலுவூட்டல் அமைச்சு
**Ministry of Women, Child Affairs and Social Empowerment**


මගේ අංකය
எனதுஇல DSD/HO/04./09/EMP/ADB/2024

ඔබේ අංකය
உமது இல........................................

දිනය
திகதி
Date 2024.06.05

දිස්ත්‍රික් ලේකම්/අතිරේක සමෘද්ධි අධ්‍යක්ෂ ජනරාල්

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

පොලොන්නරුව,අනුරාධපුර,කෑගල්ල,කුරුණෑගල,කළුතර,මහනුවර,

නුවරඑළිය,මාතලේ,යාපනය,කිලිනොච්චිය,මුලතිව්,ත්‍රිකුණාමලය,මඩකලපුව.

**<u>ආහාර සුරක්ෂිතතාව හා ජීවනෝපාය ප්‍රතිසාධන හදිසි ආධාර ව්‍යාපෘති යටතේ සවිබල ගැන්වීමේ නියමු ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම</u>**

සමෘද්ධි වැඩසටහන යටතේ සමෘද්ධි ප්‍රතිලාභීන් වෙත ලබාදුන් මුල්‍ය ආධාර සමාජ ප්‍රතිලාභ මණ්ඩලය වෙත පැවරීමක් සමඟ අස්වැසුම වැඩසටහන යටතේ හඳුනාගත් පවුල් මිලියන 1.2 සවිබල ගැන්වීමේ වගකීම සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත පවරා ඇත. ඒ අනුව අස්වැසුමලාභී පවුල් සවිබල ගැන්වීමේ ජාතික වැඩසටහන දැනටමත් ආරම්භ කර ඇත. ඒ යටතේ ආසියානු සංවර්ධන බැංකුවේ මුල්‍ය හා තාක්ෂණික සහාය ඇතිව සවිබල ගැන්වීමේ නියමු ව්‍යාපෘතියක් දිස්ත්‍රික් 13 ක ක්‍රියාත්මක වන අතර එම වැඩටහන යටතේ ඔබ දිස්ත්‍රික්කයේ තෝරාගත් ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ මට්ටමින් හඳුනාගත් හා ග්‍රාම නිළධාරි වසම්වල මූලික කටයුතු දැනටමත් ආරම්භ කර ඇත.

02. මෙම ව්‍යාපෘතියේ ක්‍රමවේදය අනුව සමාජ සුභසාධන ප්‍රතිලාභ මණ්ඩලය මගින් ලබාගත් දුප්පත් හා අන්ත දුප්පත් යන කාණ්ඩ දෙකට අයත් සමාජ ලේඛන තොරතුරු මත පදනම්ව එක් වසමකින් පවුල් 50 සමීක්ෂණයට භාජනය කරන ලදි. නමුත් ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් හරහා සවිබලගැන්වීම සඳහා තෝරාගනු ලබන්නේ ප්‍රතිලාභි පවුල් ඒකක 32 ක් පමණි. එම පවුල් ඒකක 32අදියර 03 ක් යටතේ අපක්ෂපාත හා සාධරණ ක්‍රමවේදයක් ඔස්සේ තෝරාගැනීම සඳහා අහඹු තෝරාගැනීමේ ක්‍රමවේදය භාවිතා කිරීමට අපේක්ෂා කරයි.

1. ව්‍යාපෘතියට සෘජුවම සම්බන්ධවන ප්‍රතිලාභින් 32 ක්, අදේශ කණ්ඩායමට ප්‍රතිලාභින් 3 ක් හා පාලක කණ්ඩායමට ප්‍රතිලාභින් 15 ක් ලෙස
2. ව්‍යාපෘතියට සෘජුවම සම්බන්ධවන ප්‍රතිලාභින් 32 ක්, අදේශ කණ්ඩායමට ප්‍රතිලාභින් 3 ක් හා පාලක කණ්ඩායමට ප්‍රතිලාභින් 14 ක් ලෙස
3. ව්‍යාපෘතියට සෘජුවම සම්බන්ධවන ප්‍රතිලාභින් 35 කි .මෙම අදියරේ දි අදේශ කණ්ඩායමක් හෝ පාලක කණ්ඩායමට ප්‍රතිලාභින් නොමැත


1වනඅදියර,4වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල./1ம் கட்டம், 4வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1stStep, 4 th floor, SethsiripayaBattaramulla

| | අධ්‍යක්ෂ ජනරාල්<br>பணிப்பாளர் தலைமையதிபதி<br>Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල්(පාලන හා ආයතන)<br>மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்)<br>Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී<br>பிரதான கணக்காளர்<br>Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මුල්‍ය)<br>பணிப்பாளர் (குறு நிதி)<br>Director ( Micro Finance) | කාර්යාලය<br>அலுவலகம்<br>Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dgsamurdhi@gmail.com | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | | |
| | | **Hot Line :0112-889007** | | **Hot Line:0112-885582** | **Hot Line: 011- 28** |

03. එම ක්‍රමවේදය ඔබගේ ප්‍රධානත්වයෙන් පත් කරනු ලබන කමිටුවක් මගින් දිස්ත්‍රික් මට්ටමින් සිදුකිරීමට නියමිත අතර එම ක්‍රියාවලිය සඳහා අදාල සමස්ථ මගපෙන්වීම ඇමුණුම 01 අකෘතිය මගින් ඉදිරිපත් කරමි. එහි සඳහන් උපදෙස් හා මගපෙන්වීම් අනුව ඔබ දිස්ත්‍රික්යේ වසම් මට්ටමින් සුදුසු ප්‍රතිලාභීන් හඳුනා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සංවිධානය කිරීම සඳහා දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරයාට උපදෙස් ලබාදීමට කාරුණිකවන්න. එමෙන්ම ව්‍යාපෘතියේ ඉදිරි ක්‍රියාකාරකම් ආරම්භ කිරීම සඳහා මෙම තෝරාගැනීම 2024.06 .12 ට පෙර අවසන් කළයුතු බව වැඩිදුරටත් සිහිපත් කරමි.

04. තවද මෙම ප්‍රතිලාභීන් තෝරාගැනීම අවසන් වූ පසු එම ක්‍රියාවලිය පිළිබඳව ඔවුන් දැනුවත් කිරීම සඳහා මේ සමඟ යොමු කරන ඇමුණුට 02 අකෘතියේ පිටපතක් තේරී පත් වූ පවුල් ඒකක වෙත ලබාදීම සඳහා අදාල ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත උපදෙස් ලබාදෙන්නේ නම් මැනවි.

05. එමෙන්ම ප්‍රතිලාභීන් තෝරා ගැනීමෙන් පසු ව්‍යාපෘති ක්‍රියාකාරකම් පිළිබඳව ග්‍රාම නිළධාරි වසම් මට්ටමින් ඔවුන් දැනුවත් කිරීමේ වැඩසටහනක් ප්‍රාදේශීය ලේකම් උපදෙස් අනුව සමෘද්ධි කළමනාකරුගේ සහායෙන් සමෘද්ධි සංවර්ධන නිලධාරි විසින් පැවැත්විය යුතුය. එහිදි එක් එක් ප්‍රතිලාභී පවුල් ඒකක සමඟ වෙන වෙනම ව්‍යාපෘති ක්‍රියාකාරකම් සඳහා එකඟතාවය ලබාගැනීමේ අවබෝධ ගිවිසුමකට අත්සන් කල යුතු අතර එම අවබෝධතා ගිවිසුම ද මේ සමඟ ඔබ වෙත යොමු කරමි. ( ප්‍රතිලාභීන් දැනුවත් කිරීමේ මගපෙන්වීම් ඇමුණුම 3 අකෘතිය හා අවබෝධතා ගිවිසුම ඇමුණුම 4 )

06. ඉහත උපදෙස් අනුව ඔබ දිස්ත්‍රික්කයේ ඉදිරි කටයුතු සැලසුම් කිරීම සඳහා දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරයා ඇතුලු අදාල නිළධාරින්ට අවශ්‍ය උපදෙස් ලබාදීමට කාරුණිකවන්න. මේ කෙරෙහි ඔබ දක්වන සහාය ඉතා අගේකොට සලකමි.

සී.ඩී.කළුආරච්චි

අධ්‍යක්ෂ ජනරාල්

පිටපත:- දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ, දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ කාර්යාලය, ........................ , දිස්ත්‍රික් ලේකම් උපදෙස් අනුව අවශ්‍ය කටයුතු සංවිධානය කිරීම සඳහා